# ඍග්වේදයෙහි එන මරණය හා පරලොව පිළිබඳ අතිපුරාතන භාරතීය සංකල්ප

කැලණි විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය

**පූජ්‍ය මාරඹ රතනසාර හිමි**

ඍග්වේදයේ එන x 14 අන්ත්‍යෙෂ්ටි සූක්තය හා තදනුබද්ධ ඉතිරි සූක්ත හතරත් (x 15-18) මරණය හා ආයති භවය පිළිබඳ ඍග්වෛදික යුගයේ පැවති සංකල්ප හෙළිකර දෙයි. x 15 සූක්තයේ 14 මන්ත්‍රයේ එන "යෙ අග්නිදග්ධා යෙ අනග්නිදග්ධා මධ්‍යෙ දිවඃ ස්වධයා මාදයන්තෙ" යනුවෙන් "ගින්නෙන් දවනු ලැබුවෝ හා නොදවනු ලැබුවෝ දෙව්ලොවදී ස්වධාවෙන් සතුටු කරනු ලැබෙත්" යන කියමනෙන් මිනී වළලැමත් දැවීමත් දෙකම එවක පැවති බැව් පැහැදිලි වේ. එහෙත් මිනී දැවීම මෘතදේහයක් පිළිබඳ ප්‍රධාන සංස්කාරය වූ අතර ආයතිභවය පිළිබඳ පුරාකථාවන්ට එය මුල්වූ බැව් පෙනේ.

ඍග්වේදයට අනුව මළ තැනැත්තාට හිමි වන තැන නම් උසස්ම දෙව්ලොවයි. විෂ්ණුගේ පරම ස්ථානයයි. මරණයේදී ආත්මය සිරුරෙන් බැහැරව ගොස් පෙර පියවරුන් ගිය මාර්ගයෙන් ගමන්කොට දෙවියන්ගේ ප්‍රභාවයෙන් යුතු ඒ සදකාලිකව ආලෝකය තිබෙන දෙව්ලොවට යයි. ඒ දෙව්ලොව නම් පළමුවෙන් මිනිස් ලොව සිට මියගිය තැනැත්තා වන යමරජුගේ වාසස්ථානයයි. යමරජු මෙන් ම වෙනත් පූර්ව පියවරු ද ඔහුට එහිදී මුණගැසෙති.

යමලොවට යන තැනැත්තාට අතරමග රකවලෙහි සිටින ඇස් හතරක් (ඇස්වලට ඉහළින් ඇතැම් බල්ලන්ට තිබෙන්නාක් වැනි ලප දෙක මෙහිලා ඇස් දෙකක් හැටියට ගණන් ගෙන ඇති සේ සැලකිය හැකියි.) හා මහා නාසයක් ඇති, මිනිසුන් බලන, යමගේ දූතයන් වූ බල්ලෝ දෙදෙනෙක් හමු වෙති. ඒ බල්ලන් පසු කොට හොඳ මගින් ගොස් යම හා සමග එක්ව ප්‍රීතිවෙමින් සිටින පියවරුන්ට එක් වන ලෙස අයදනා ලැබේ. යමරජුගේ දූතයන් වන ඒ සුනඛයෝ එසේ යන්නවුන්ට අවශ්‍ය සැපය ලබා දීමට උදව් වෙති.

අවෙස්ථාවේ සඳහන් වනුයේ කහපාට කන් හා සිව් නෙත් යුතු එක් බල්ලකු පිළිබඳව ය. මෙලොව සිට එලොවට යන මාර්ගයෙහිවූ "චින්වත්" නම් පාලම ළඟ සිට මළවුන්ගේ ආත්මයන්ට එතරට යාමට බාධා කරන භූතයන් මගහරවාලීම ඔහුගේ කාර්යයයි.

වරුණ දෙවියා ද යමරජු සමග සම්බන්ධ කොට දක්වනු ලබන්නෙකි. පෙර පියවරුන් ගිය මගින් ගියවිට "ස්වධා" වෙන් සතුටු වන යම හා වරුණ යන රජවරුන් දෙදෙනා දක්නට ලැබෙන බව එක් මන්ත්‍රයක සඳහන් වේ. (x 14.7) වරුණ දෙවියාට අයත් වන කාර්ය නම් වැරදිවලට සමාව දීමයි. ඒ එකම දෙවියකුවත් පරලොව යන්නවුන්ගේ නඩු විසඳීමක් ගැන ඍග්වේදයේ මෙන් ම අවෙස්තාවේද සඳහන් නොවේ.

යමලොවට යන්නවුන්ට දෙවියන්ගේ අනුකම්පාව දීර්ඝායුෂ ලැබීමට හේතුවන අතර ඔවුන් මිනිස් ලොවදී කළ ඉෂ්ටාපූර්ත එනම් යාග (ඉෂ්ට) හා පූජකවරුන්ට කළ පරිත්‍යාග (ආපූර්ත) ද ඒ ජීවිතය පවත්වා ගැනීමට හේතු වෙයි. තව ද මිහිපිට සිටින ඔවුන්ගේ නෑදෑයන් කරන පිංකම් ද ඔවුන්ට පිහිට වෙයි.

පින්දහම් කළවුන්ට දෙව්ලොවක් මෙන් පව් කළවුන්ට දුක් දෙන තැනක් ගැන ද ඇපැහැදිලිමුත් අදහස් ඍග්වේදයේ පළ වේ. (ii 29.6; iv 5.5) නරක ලෝකය පිළිබඳව නම් පළමු වරට සඳහන් වනුයේ අථර්වවේදයේ ය. (xii 4.36)

වෛදික ආර්යන් වැඩි දෙන තමන් හොඳ මිනිසුන් බියෙන් දෙව්ලොව සැප සම්පතට හිමිවන බව ඇදහූහ. එහෙත් මිනිස් ලොව සැපත පහත් ලෙස ඔවුහු නොසැලකූහ. බ්‍රහ්මන් යුගයේ අග දක්වාමත් පැවති සාමාන්‍ය විශ්වාසය නම් සූර්යාලෝකය දැකීම, සියක් වසක් ජීවත්වීම ඒ සඳහා අවශ්‍ය ආයාචනා හා මන්ත්‍ර උපයෝග කර ගැනීම වැදගත් බවයි. අන්තිමේදී මිනිස් දිවියට තරමක් වෙනස් වුවත් සැහෙන තරම් සමාන වූ එහෙත් මානුෂික දුර්වලතා නිසා ඇතිවන අඩුපාඩුවලින් තොර ජීවිතයක් ඔවුහු ප්‍රාර්ථනා කළහ.

## ඍග්වේද x 14 අනන්‍යෙෂ්ටි සූක්තය

1. විශාල හෙල් දිගේ පරලොවට ගිය, බොහෝ දෙනා සඳහා මාර්ගය සොයා දුන්, ජනයා එක් රැස් කරන්නාවූ විවස්වත්ගේ පුත්‍රයා වූ **යමරජහු** යාගද්‍රව්‍යයෙන් පුදව.

2. යමරජ අප සඳහා මාර්ගය ප්‍රථමයෙන් සොයා ගෙන ඇත්තේ වෙයි. මේ ගොදුරු බිම පැහැර ගත හැක්කක් නොවේ. අපගේ පූර්ව පියවරු යම් තැනකට ගියාහු නම් එතැනට (දූත් ඉපදී සිටින්නාහු නැතහොත් ඒ අනුසාරයෙන් ම මග දැනගත්තාහු ස්වකීය මාර්ගයන් දිගේ යන්නාහු ය.

3. මාතලි තෙම කව්‍යයන් විසින් ද, යම තෙම අංගිරස්වරුන් විසින් ද, බෘහස්පති තෙම ඍක්වයන් විසින් ද වඩනු ලබන්නේ ය. දෙවියෝ යම් කෙනකුන් වර්ධනය කළාහු ද, යම් කෙනෙක් දෙවියන් වර්ධනය කළාහු ද **එයින්** සමහර කෙනෙක් ස්වාහා කියා ඇමතීමෙන් ද, සමහර කෙනෙක් මළවුන් සඳහා දෙන ආහාරයෙන් ද සතුටු වෙති.

4. එම්බා යමය, පියවරුන් වූ අංගිරස්වරුන් හා එක්ව මේ තණ ඇතිරියෙහි හිඳගත මැනවි. ඍෂීන් විසින් ප්‍රකාශ කරන ලද **මන්ත්‍රයෝ** තොප මෙහි කැඳවත්වා; රජතුමනි, මේ යාග පූජාවෙන් සතුටු වනු මැනවි.

5. යමරජතුමනි, පූජාර්හ වූ අංගිරස්වරුන් සමග එනු මැනවි. මෙහිදී වෛරූපයන් - විරූපයාගේ පුතුන් සමග සතුටු වනු මැනවි. යමෙක් තොපගේ පියා වේද, (ඒ) විවස්වත්හු (මම) කැඳවමි. (හෙතෙම) මේ යාගයේදී කුසතණ ඇතිරිය මත හිඳ (සතුටු වේවා!)

6. අපේ පියවරුන් වූ අංගිරස්හුද නවගවයෝ ද අථර්වන්හු ද, සොමපානය ප්‍රියකරන ඍගුහු ද අපේ පියවරු වෙති. අපි ඒ පූජාර්හයන්ගේ හොඳ හිතෙහි යහපත් වූ ප්‍රසාදයෙහි කොටස්කරුවෝ වෙමු.

7. යම් මගක අපේ පූර්ව පිතෘහු ගියාහුද ඒ පුරාතන මාර්ගයන්ගෙන් ඉදිරියට යව; එහිදී ස්වධාවෙන් සතුටු වන යම හා වරුණ යන රජවරුන් දෙදෙන, (එනම්:) දක්නට හැකි වන්නේය.

8. යාගයෙන් හා වෙනත් යාගවත් ක්‍රියාවලින් පරම ස්වර්ගයේ පියවරුන් හා එක් වෙව. වැරදි හැර දමා නැවතත් (තම) ගෘහයට පැමිණෙව. මනා තේජස් ඇතියේ තම ශරීරය හා එක්වෙව.

9. මෙයින් ඉවත් වෙවු; අහකට යවු. පියවරුන් මේ ස්ථානය මොහු සඳහා ය සකස්කොට ඇත්තේ. යමරජ තෙම දිනවලින්, ජලයෙන්, රාත්‍රීන්ගෙන් පැහැදිලි වූ විශ්‍රාම ස්ථානයක් මොහුට දෙයි.

10. සරමාවගේ පුත් වූ, සිව් නෙත් යුතු, පුල්ලිවැටුනු ශුනකයන් දෙදෙනා ඉක්මවූ යහපත් මාර්ගයෙන් දුවව. එවිට යමරජු හා සමග එක්ව යමෙක් සතුටු වෙත් නම් (ඒ) පරිත්‍යාගශීලී පියවරුන් කරා එළඹෙව.

11. යමරජතුමනි, තොපගේ ආරක්ෂකයන් වූ, **සිව්** නෙත් යුතු මග රැක සිටින, මිනිසුන් බලන, යම් ශුනකයන් දෙදෙනෙක් වෙත් නම් රජතුමනි, ඔවුන් දෙදෙනාට මොහු භාරදුන මැනවි. මොහුට සෞභාග්‍යයේ හා ස්වාස්ථ්‍යය දෙනු මැනවි.

12. මහත් නාසා ඇති, දිවි පැහැර ගන්නාවූ යමරජුගේ දූතයන් දෙදෙන ජනයා පසුපස හැසිරෙත්. ඔවුන් දෙදෙනා අපහට මෙහිදී නැවත හිරු දැකීම සඳහා යහපත් ජීවිතයක් දේවා!

13. යමරජු සඳහා සෝම මිරිකවු; යමරජු සඳහා යාගද්‍රව්‍ය පුදවු. සකස් කරන ලද යාගය, ගින්න දූතයා කොටගෙන යම රජු කරා යයි.

14. යමරජුට ගිතෙල් සහිත යාග ද්‍රව්‍ය පුදවු. ඔහු වෙතට පියවර ද තබවු. හෙතෙම දීර්ඝ ආයුෂයක් ජීවත්වීම සඳහා අප දෙවියන් කරා පමුණුවව්

15. යමරජුට අධික මීපැණියෙන් යුතු වූ යාග ද්‍රව්‍ය පුදවු මේ නමස්කාරය පෙර සිටි ඍෂිවරුන්ටයි; පෙර සිටි මාර්ග සම්පාදකයන්ටයි.

16. සෝම බඳුන් තුනකින් එය පියාසර කරයි. ෂෘර්වී හය ද, එකම මහා ලෝකය ද, ත්‍රිෂ්ටන් ගායත්‍රී ඡන්දස් යන මේ සියල්ල යම වෙත තබන ලදහ.

### ඡන්දස: ත්‍රිෂ්ටුභ් 13, 14, 16 අනුෂ්ටුභ්, 15 බෘහතී

1. **පරෙයිවාංසම්** — පරා + ඊයිවාංසම්; පරා + √ඉ (ගමන්හි) ලිට් (ප්‍රකෘතික) කෘදන්ත **ප්‍රවතඃ** — ප්‍ර උපසර්ගය හා වත් ප්‍රත්‍යය එක්වීමෙන් හැදුණු පදයකි. උත්තර, උත්තම ශබ්ද හා සසඳන්න. **මහීඃ** √මහ් (මහා) යන ධාතුවෙන් හැදුණු මහී යන ස්ත්‍රීලිංග පදයේ ද්වි බහු. **අනුපස්පශානම්** — අනු + √ස්පශ් (බැලීමෙහි) ආත්මනෙ ලිට් කෘදන්ත. √ස්පශ් — ද්විත්වයෙන් පස්පශ් වේ. **දුවස්‍ය** — දුවස් — නපුංසකයය, දුවස්‍ය (දුවස් + ය) නාමධාතුක ක්‍රියා.

2 **ගාතුම්**—මාර්ගය √ගා(ගමන්හි iii පර.) + තු. පුංලිංග මෙය ප්‍රසිද්ධ ‘ තුම්’’ ප්‍රත්‍යය නොවේ. පසුව ‘‘තුම්’’ ප්‍රත්‍යය බවට හැරී ඇත්තේ මෙය මැයි. **ප්‍රථමඃ** ක්‍රි. වි. **අපභර්තවෙ** — අප + √භෘ (ගෙන යාමෙහි) + **තවෙ** — තුමර්ථක **ප්‍රත්‍යය** (පාලි — තවෙ) සංස්කෘතයේ භෘ යනුවෙන් ඇත්තේ භකාරාංශය නැතිව ගිය මේ ධාතුව මැයි. **උ** මේ ප්‍රයෝගය කර්මකාරකාර්ථයට බරව පවතී. මෙහි උදාත්ත ස්වරය ආදි අන්ත ස්වර දෙකටම **යෙදේ** උදාත්ත ස්වර දෙකක් ළඟ ළඟ යෙදෙන නිදසුන් ඉතා විරලය. **යත්‍රා** ඡන්දොහෙතුක දීර්ඝයයි. **එනා** — අ යන සර්වනාමයේ තෘතිය එක **ජඥනාඃ** — √ජන් (දැනවීමෙහි) + ආන; ලිට් — (ආඛ්‍යාතක) කෘදන්ත. මෙහි ධාතුව √ඥ ලෙස ගතහොත් අර්ථය දන්නාහු යනු විය යුතුයි.

3. **මාතලී** — ඉන්ද්‍රගේ රියැදුරා. මාතලි රියැදුරා කොට ඇති තැනැත්තා එනම් ඉන්ද්‍රයා යයි කියන සිතයි, එහෙත් ඉන් අන්ත නාමවල උදාත්තය නිශ්චිතවම අග ස්වරයට යෙදෙන හෙයිනුත් මෙහි **එවැන්නක්** නැති හෙයිනුත් ඒ අරුත නොගැළපේ. **කව්‍යෛඃ** කව්‍ය නම් පුරාතන — පිතෘවරුන් පිරිසකි. සහාර්යෙහි තෘතීයා. **අංගිරොභිඃ** බෘහස්පතිට සම්බන්ධ පුරාතන පිතෘවරුන් පිරිසකි. බෘහස්පතිට **ආංගිරස** යන නම යෙදේ. **ඍක්වභිඃ** — ඍක්ව නම් බෘහස්පති ඇසුරේ හැසිරෙන සංගීතයේ නිපුණ භූතයන් පිරිසකි. වාවෘධානඃ √වෘධ + ආන, වර්තමාන ආත්මනෙ. කෘ. **යාංශ්ච දෙවා වාවෘධුර් යෙ ච දෙවාන්** — ෂෘර්වියේදී ඇරඹුණු පියවරුන්ගේ හා දෙවියන්ගේ අන්‍යොන්‍ය සහාය

හා පෝෂණය දෙව්ලොවදීද පැවැත්වෙන බැව් මෙයින් ඇඟේ. වාවෘධුඃ ඡන්දෝහේතුක දීර්ඝය වවෘධුඃ යනු පදපාඨයි. √වෘධ් (වර්ධනයෙහි) ලිට් පර. ප්‍ර. බහු යනු දෙවියන්ට පූජා කිරීමේදී හඬ නගා කරන ප්‍රකාශයකි. **ස්වධා** යනු පිතෘන්ට පූජා කරන මිහිරි පානයකි. **මදන්ති** — සතුටු වෙත්. √මද් — (තුටුවීමෙහි) i. ලට් පර. ප්‍ර බහු.

4. **ප්‍රස්තරම්** — ඇතිරියෙහි. ආ—සීද යන ක්‍රියා යෝගයෙහි ආධාරාර්ථයේ ද්විතීයා √ස්තෘ (ඇතිරීමෙහි). **ආසීද**. හිඳ ගනු මැනව. √සද් (හිඳ ගැනීමෙහි) ලොට් එක. **අංගිරොභිඃ** යන්නෙන් දක්වුනේ පියවරුන්ටම නමකි. **සංවිදානඃ** √විද් (හමුවීමෙහි) වර්තමාන ආ. අඛ්‍යාතක (කෘදන්ත). එනා — එන නාමයේ තෘතියා එක. **මාදයස්ව** √මද් (ප්‍රීති වීමෙහි) ප්‍රයොජ්‍ය ලොට් ආ. ම. එක

5. **ආගහි** — √ගම් ධාතුලුඩ් ප්‍රකෘත්ත ලොට් පර. ම. එක. හුවෙ — √හූ (කැඳවීමෙහි) ලට් ආ. උත්තම එක. මෙහි කුස තණ මත හිඳීම සඳහන් වනුයේ දෙවියන් පිළිබඳවය.

6. **අපි ස්‍යාම** යන පද දෙක එකට සම්බන්ධ කොට ගත යුතුයි. අර්ථය: ''සහභාගි වෙමු'' යනුයි.

7. **උභා රාජානා මදන්තා** — උභෞ රාජානෞ මදන්තෞ යන රූප වෙනුවට යෙදුණු ෂා ආන්ත රූපයි. මේ වෛදික භාෂාවේ විශේෂ ලක්ෂණයකි. යම වරුණ දෙදෙනාම රජුන් හැටියට සැලකෙතත් ඍග්වේදයේ දෙවියකු ලෙස ගැනෙන්නේ වරුණ පමණි. **පශ්‍යාසි** — √ස්පශ් (දැකීමෙහි) ලට් ප්‍රත්‍යත්ත ලෙට් මධ්‍යම ඒක. මෙහි ආදි සකාරය ලොට් වී ඇත. සංස්කෘතයේ මෙය √දූශ් ධාතුව ලෙස දක්වේ.

8. **සං ගච්ඡස්ව පිතෘභිඃ සං යමෙන** — මෙහි සං උපසර්ගය ගච්ඡස්ව යන ක්‍රියාපදය හා දෙවරක් යෙදී තිබේ උපසර්ගය සංස්කෘතයේ මෙන් ක්‍රියාවට ළං කොට නොයෙදීම ඍග්වේදයේ ලක්ෂණයකි. පරමෙ **ව්‍යෝමන්** — පරම ව්‍යෝමය නම් යම හා පියවරුන් වෙසෙන උසස් ම ස්වර්ගයයි. **ව්‍යෝමන්** — අවිභක්තික — **විභක්ති රහිත** — සප්තමීයි. **හිත්වාය** — පූර්වක්‍රියා. **අස්තම්** — පියවරුන්ගේ නිවස. එහි = ආ + ඉහි. √ඉ—ගමන්හි. ලොට් පර. එ, එක.

9. **අපෙත** — අප + ඉත = ඉවත්ව යව්. ලොට් පර. ම. බහු වීත — වි + ඉත විසිර යව. ලොට්. පර. ම. බහු **අක්‍රන්** - √කෘ ධාතුලුඩ පර. ප්‍ර, බහු. **අද්භිඃ** — ජලයෙන්, **අක්තුභිඃ** — රාත්‍රීන්ගෙන්. **අවසානම්** — විවේක ස්ථානයක්. අව — √සා = සි බැඳීමෙහි.

10. **සාරමෙයෞ** — සරමාවගේ පුත් වූ; **අථා** — පූථ. ඡන්දෝ හේතුක දීර්ඝයයි. සුවිදත්‍රාන් + උපෙහි — සුවිදත්‍රා- **උපෙහි** යමෙන — සහාර්ථක තෘතීයා. **සධමාදම්** — එක්ව සතුටුවීම. සධ යනු සහ යන පදයේ මුල් රූපයයි. 1 පාදයේ **ශ්වානෞ යන්න** ශුවානෞ කියා කිය යුතුය. 2 පාදය ජග්තී ඡන්දසිනි.

11. **ශ්වානෞ** යන්න ශුවානෞ කියා උච්චාරණය කළ යුතුයි. 2 පාදය ජගතී ඡන්දසිනි. **ධෙහි** — √ධා (තැබීමෙහි) ලොට් පර. ම. එක.

12. **උරූණසෞ** — උරූණසෞ යන්නේ ඡන්දෝහේතුක දීර්ඝයයි. **දෘශයෙ** — √දෘශ් — චතුර්ථී තුමර්ථික. සූර්යාය යන්න ෂෂ්ඨාර්ථික වුවත් චතුර්ථී යෙදී ඇත්තේ දෘශයෙ යන චතුර්ථී තුමර්ථකයේ ප්‍රභාවෙනි. **දතාම්** — √ද (දීමෙහි) ධාතුලුඩ් ප්‍රකෘතික ලෝට් ප්‍ර. ද්වි

13. **ජුහුතා** — ජුහුත යන්නේ ඡන්දෝහේතුක දීර්ඝයි. **අරංකෘතඃ** — ලෞකික සංස්කෘතයේ ර/ල පෙරලීමෙන් අලංකෘතයි හැදෙන්නේ මෙයයි.

14. **ආ යමත්** — √යම් (විස්තරයෙහි) ධාතුලුඩ් ප්‍රකෘතික **ලේට්**. **ප්‍රජීවසෙ** — චතුර්ථී තුමර්ථක.

15. **ජුහොතන** — √හු — (යාගයෙහි) ලොට් ම. බහු. තන ප්‍රත්‍යයයි, මෙහි ගුණ ස්වරය ඡන්දෝ හේතුය. නැතහොත් **එය** ''ජුහුතන'' විය යුතුය.

## ඍග් x 14 සූක්තයේ මන්ත්‍රයන්ගේ පදන්වය

1. ප්‍රවතඃ — මහීඃ — අනු — පරෙයිවාංසං — බහුභ්‍යඃ — පන්ථාං — අනුපස්පශානං — ජනානාං — සංගමනං — වෛවස්වතං — යමං රාජානං — හවිෂා — දුවසන්.

2. යමං — නඃ — ගාතුං — ප්‍රථමඃ — විවේද — එෂා — ගව්‍යූතිඃ — න — අපභර්තවෙ — නං — පූර්වේ — පිතරඃ — යත්‍ර — පරෙයුඃ — (තත්‍ර) — එනා — ජඥනාඃ — ස්වාඃ — පථ්‍යාඃ — අනු — (පරායන්ති.)

3. මාතලී — කව්‍යෛඃ — යමඃ — අංගිරොභිඃ — බෘහස්පතිඃ — ඍක්වභිඃ — වාවෘධානඃ — දෙවාඃ — යාන් — වාවෘධුඃ — යෙ — ච — දවාන් — වාවෘධුඃ — අන්‍යෙ — ස්වාහා — අන්‍යෙ — ස්වධයා — මදන්ති.

4. යම — පිතෘභිඃ — අංගිරොභිං — සංවිදනඃ — ඉමං — ප්‍රස්තරං — ආසීද — කවිශස්තාඃ — මන්ත්‍රාඃ — ත්වා — ආවහන්තු — රාජන්, එනා — හවිෂා — මාදයස්ව.

5. යම — යඥියෙභිඃ — අංගිරොභිඃ — ආග්හි — ඉහ — වෛරූපෙඃ — මාදයස්ව — යඃ — තෙ — පිතා — තං — විවස්වන්තං — අහං — හුවෙ — (සං) අස්මින් — යඥෙ — බර්හිෂි — ආ නිෂද්‍ය — (මාදයතාම්)

6. අංගිරසඃ — නවග්වාඃ — අථර්වාණඃ — සෞම්‍යාසඃ — භෘගවඃ — නඃ පිතරඃ — වයං — තෙෂාං — යඥියානං — සුමතෞ — භද්‍රෙ — සෞමනසෙ — අපි — ස්‍යාම

7. යත්‍ර — නඃ — පූර්වේ — පිතරඃ — පරෙයුඃ — තෛඃ — පූර්ව්‍යභිඃ — පථිභිඃ — ප්‍රෙහි — ප්‍රෙහි — (තත්‍ර) — ස්වාධයා — මදන්තා — යමං — වරුණං — දෙවං — ච — උභා — රාජානා — පශ්‍යාසි

8. ඉෂ්ටාපූර්තෙන — පරමෙ — ව්‍යෝමන් — පිතෘභිඃ — සං — ගච්ඡස්ව — යමෙන — සං (ගච්ඡස්ව) අවද්‍යං — හිත්වාය — පුනඃ — අස්තම් — එහි

9. අපෙත — වීත — විසර්පත ච — පිතරඃ — එතං — ලොකං — අස්මෙ — අක්‍රන් — යමඃ — අහොභිඃ — අද්භිඃ — අක්තුභිඃ — ව්‍යක්තං — අවසානං — අස්මෙ — දදති.

10. සාරමෙයෞ — චතුරක්ෂෞ — ශබලෞ — ශ්වානෞ — සාධුනා — පථා — අති — ද්‍රව — අථ — යමෙන — යෙ — සධමාදං — මදන්ති — සුවිදත්‍රාන් — පිතෘන් — උපෙහි

11. යම — තෙ — රක්ෂිතාරෞ — චතුරක්ෂා — පථිරක්ෂී — නෘචක්ෂසෞ — යෞ ශ්වානෞ — රාජන් — තාභ්‍යාං — එනං — පරිදෙහි — අස්මෙ — ස්වස්ති — ච — අනමීවං — ච — ධෙහි.

12. උරූණසෞ — අසුතෘපෞ — උදුම්බලෞ — සමස්‍ය — දූතෞ — ජනාන් — අනු — චරතඃ — තෞ — අද්‍ය — අස්මභ්‍යං — පුනඃ — සූර්යාය — දෘශයෙ — ඉහ — භද්‍රං — අසුං — දතාම්

13. යමාය — සොමං — සුහුතං — යමාය — හවිඃ — ජුහුත — අරංකෘතං — යඥඃ — අග්නිදූතඃ — යමං — හ — ගච්ඡති

14. යමාය — ඝෘතවත් — හවිඃ — ජුහොත — ප්‍රතිෂ්ඨත — ච — සඃ — නඃ — දීර්ඝං — ආයුඃ — ප්‍ර — ජීවසෙ — දෙවෙෂු — ආයමත්

15. යාමය — රාඥෙ — මධුමත්තමං — හව්‍යං — ජුහොතනං — ඉදං — නමඃ — පූර්වේජෙභ්‍යඃ — ඍෂිභ්‍යඃ — පූර්වේභ්‍යඃ — පථිකෘද්භ්‍යඃ

16. (තත්) ත්‍රිකද්‍රුකෙභිඃ — පතති — ෂට් — උර්වීඃ — එකං — ඉත් — බෘහත් — ත්‍රිෂ්ටුභ් — ගායත්‍රී — ඡන්දාංසි — සර්වාඃ — තාඃ — යමෙ — ආහිතාඃ